# 31

ෂවර් වරුවේ උපසේන උණු වතුර ස්නානයකින් සන්තෘප්තිය වී නාන කාමරයෙන් නිදන කාමරයට එන විටම මෙන්, උපනෝ කාමරයට ඇතුළු විය. උපනෝගේ දෑතේ වූයේ අලුත්ම ඇඳුම් කට්ටලයකි. අඟනා කලු කලිසමක්, ලා නිල් පැහැ කමිසයක්, දිලිසෙන කලු (පම්ප්ස් වගියේ) සපත්තු යුගලක්, බෝ ටයි පටියක්, කලු මේස් කුට්ටමක්- එපමණක් නොවේ අලුත්ම යට ඇඳුම්- බැනියමක් සහ බොක්සර් වගියේ යට කලිසමක්.

"සර්ට අද රෑ පාටියට - ඇඳුම්" සපත්තු දෙක ඇඳ අසල බිමින් තබමින් අනෙක් සියල්ල ඇඳ මත සීරුවට තබමින් උගනෝ පහත් හඬින් කීවේය.

"අද රෑ ? පාටිය ?"

"ඔව් සර්. ෆුල් මූන් පාටිය"

"ෆුල් මූන් පාටිය ?"

"ඔව් සර්."

ඉඟ වටා දවටා සිටි තුවාය බිම හෙලමින්, උපසේන කවුළුවෙන් පිටත බලන අතරේ උපනෝ දොර වසමින් පිටව ගියේය.

කවුළුවෙන් පිටත තවම ලා අව්වක් වැටෙයි. එය සහාන් ආලෝකයකි. තව මදකින් කළුවර වැටෙන බව කියන පෙර නිමිත්තක් මෙනි මේ ආලෝකය.

ඇඳ වෙතට ආ උපසේන යට කලිසම අතට ගෙන සිඹ බැලුවේය. ම්! රෝස මල් සුවඳයි. අර වටබිමා ළඟ ඇත්තේත් මේ සුවඳමයි. ඒකින් පාටියට ලැස්ති වෙනවා ඇති. නුමදුම පාටි- කෙහෙල්මල් පාටි- ෆුල් මූන් පාටිය! පාටි දාන්න මොනතරම් හරි හේතුවක් තියෙනවා - බර්ත් ඩේ කියයි, වැලන්ටයින් කියයි, ඇනිවර්සරි කියයි - කනවා, බොනවා, ජොලි කරනවා.

උපසේන යට කලිසම ඇඳ ගන්නා විටම වටබිමා දොර හැරගෙන කාමරයට ආවාය- ඈ දිලිසෙන රතු කොට ගවුමක් හැඳලාය. එය බීන ආරකි. "ආරං ඔයා දැන්ටම ලැස්ති වෙනවද, උපා ?"

"වෙන මොනවා කරන්නද මෙතන ?"

බැනියම නොඇඳම උපසේන කමිසය ඇඟ ලා ගත්තේය.

"බැනියම අඳින්නෙ නෑ?"

මේකට ඕන නැති මඟුලක් නෑ - උපසේනට සිනැහුණි. හුම ලෝම ගොයන්න අගන්න ඕනෑ. හුම හැරීමත් මෙහෙම නොවෙයි.

"බැනියම රස්නෙ වැඩියි"

"ඒක හරි. ඒ උනාට අද ඌ වෙනකොට සීතල වෙයි. හද බැද්දියෙ ඇවිදින්න යන්නෙ නැද්ද?"

"මොනව කියල බලන්නද?"

"ඇයි හද?" කී පංචිමා, සිනාසී ඇඳ කෙළවර හිඳ ගත්තාය.

උපසේන, මේස ලෙස ගෙන, මේසය අසල පුටුවේ හිඳ මේස ලෙස ලා ගත්තේය. මේසය මත වූ කොළ ගොන්න, පංචිමාගේ නෙත ගැටුණේ මේ මොහොතේය.

"ඔබ කාලිංගගෙ කතා ලියන්න පටන් ගත්තද?"

"තාම නෑ. අදහස් ගොනු කරනව විතරයි."

පංචිමා නැගිට ඇවිත් උඩින්ම වූ කඩදාසිය දෙස බැලුවාය.

එහි ලියා තිබුණේ,

"මම ලියමි -" කියා පමණි.

ඊයට යටින් මම ලියමි - මම ලියමි කියා කීප වතාවක් ලියා තිබිණි.

පංචිමා කිසිවක්ම නොකියා ඊළඟ කඩදාසිය දෙස බැලුවාය.

එහි වැඩ් කීපයක් මෙසේ ලියා තිබුණි.

"කලුතරම දකුණු දෙසින් මුහුදු බඩව පිහිටි, ඇත් ගන්දර කල වුව ඉතා සිත් ගන්නා සුපිරි ස්ථානයකි. පොල් රුප්පාවෙන් බෙදන ලද පරිසරයේ වඩාත් කැපී පෙනෙන්නේ දියවඩන මන්දිරයයි."

"හරි ලස්සනයිනෙ ඔයා ලියනවා," පංචිමා කීවාය. "මට ආසයි ඉතුරු ටිකත් කියවන්න." ඇය උපසේනගේ හිස අත ගෑවේ පිටුපසින් සිට ගෙනය. අනතුරුව ඈ ඔහුගේ උරහිස මත වැටුණු කෙස් ගසක් අතැඟිලිවලින්

පිස දැමුවාය.

"ඉතුරු ටික!" යැයි මුමුණමින් හිඳගත් තැනින් නැගී උපසේන ඇඳ වෙතට ගොස් ඒ අසල සිටගෙන කලිසමට බැස්සේය. ඔහු නැමීය, කලිසමට යට කොට සිපරය ළඟම අදිද්දී, පංචිමා කාඩිනමින් ගැළවීන ඒ සඳහා ඔහුට උදව් කළාය.

"මට - පුළු-වන්" උපසේන කියද්දී පංචිමා ඔහු ඉදිරියේ දණ නමා හිඳ ඔහුගේ අලුත්ම පාවහන් යුගල දෙපයට ලං කළාය.

"එන්න ඔයාට - සපත්තු දාන්න."

ඈ ලං කළ සපත්තුවට ඔහු පය ඔබා, ඇතුල් කළේය. 'ර' උගට අනෙක් සපත්තුව.

"මෙහෙ මාව කැරකිල්ල කරනවා," උපසේනට සිතුණි. "දුසි බාරියාවක් වගේ."

"කෝ මේ ඔයා සිපර් එක හරියට දාලා නෑ" කී ඇගේ ඇඟිල්ල ඒ වෙතට ලංවිය.

අනතුරුව මඳ වේලාවකට ඇගේ මුව අඳුරු වුණි. ඈ උපසේනව ඇඳ අතට හෙමින් තල්ලු කළාය. ඔහු ඇඳෙහි ළඟ බැම්මෙන් ඇල වුණේ දෙපා පහතට එල්ලා වැටෙද්දීය. ඇගේ දෑඟිලි කකුළු අඬු මෙන් ඔහුගේ දෙපා අල්ලා ගති.

උපසේන සිවිලිම මැද කැරකෙන විදුලි පංකාව දෙස බලා සිටියේය. ඔහුගේ සිතුවිලි හුනස් විය. වලාකුල් මැද පාවී යන්නාක් වැනි සැහැල්ලුවකින් ඔහු දෙනෙත් පියා ගත්තේය.

'මෙතැන හොඳයි' ඔහුට සිතුණි. 'මොනවයින් අඩුවක් ද? කාලිංගගේ පොත් ලිය ලියා ඉන්න පුළුවන් - මොනවායින් අඩුවක් ද?'

"උපා ලෑස්ති වෙලා, පහලට එන්න" මඳ වේලාවකට පසු පංචිමා කීවාය. ඈ නම කොට සේද දීන ගවුමේ කර පටිය සකසා කර ගත්තාය.

"මං යනවා - පාටියේ වැඩ තියෙනවා"

ඈ පිටව ගියේ දොර හැර දමලාය.

නාන කාමරයේ කැඩපතින් බලා හිස කෙස්

සකස් කරගත් උපසේන සෙමින් හිරිගල වැඩ සහිත මාලයට ආවේය.

ප්‍රධාන ශාලාවේ මහා මේසය මැද කොයෙකුත් කෑම බඳුන් පිළිවෙල වෙමින් තිබිණි. විරේකා කාරයට සරිලන කලු - සුදු ගවුමක් හැඳගෙන යුහුසුළුව ඈත මෑත ගියේ බඳුන් සකස් කරමිනි. ඈ දෝසෙවන් ක්‍රියාශීලීව යම් යම් විධාන දුන්නාය. ඇගේ ගුණාංග කාන්තිය දහරිය ගලයි. ඇගේ ජීවිතයම මෙන්නාය.

අලුතින් නිමවෙන මන්දිරයේ වැඩ කරන ගමා, ඇල්බී, පින්ටෝ සහ අන්ද්‍රේ ආවතේව කරුවන් අඳින නිල ඇඳුම් හැඳගෙන මේස පුටු සකස් කරති. මල් බඳුන් සකස් කරති. ඒ හැරෙන්නට අලුත් සේවකයින් දෙදෙනෙක්ද දෙරෙදි ශාලයින් සේ දිග කලු කබා හා සුදු සරම් හැඳ බලා සිටිති.

"හොක්සා! උදා!" විරේකා ඔවුන් දෙදෙනාට කතා කළාය. "බලං ඉන්නෙ. අර පිටු පස්සෙ මිදුලෙ කලපුව පැත්තෙ පුටු ටික හරි ගස්සන්න" ඇගේ විධානයට අනුව දෙදෙනාම හිස නමා ආචාරයක් කරමින් දොරටුව අතට ගමන් ගත්හ.

"හොක්සා! උදා!" උපසේන තමාටම මිමිණුවේය. 'දෙන්නම දැකල පුරුදුයි වගේ- හරි -හරි බිම් ගෙයි කාමරයේ රතු අඳුරු වළල්ලේ සිටි කීප දෙනා අතරේ මොවුන් දෙදෙනාත් සිටියා මතකයි. හොක්සා- උදා.'

හොක්සා හා උදා අනුව උපසේනද කලපුව අතට ගියේය. දෙදෙනාම නිහඬව පුටු සකස් කරන්නට වූහ.

'හොක්සා? හොක්සා කියන්නෙ දෙයියනේ මේ සමන් බටබාර ඇහැලේ ගම නේද?' උපසේන තමාටම කියා ගනිමින් ඔහු අතට ගමන් ගත්තේය.

"සමන් - සමන් බටබාර?" උපසේන වඩාත් හඬ නොනගා කතා කළේය.

හොක්සා උපසේන දෙස නොබලූ හෙයින් උපසේන වඩාත් ලංව ඔහුගේ උරහිසකට අත තැබුවේය.

හෙක්ණා යන්තමට හිස හරවා බැලුවේ උරහිස මත මොකෙක්දෝ ලැගුම් ගන්නාක් මෙනි. උපසේන අත ඉවතට ගත්තේය.

"සමන් බණ්ඩාර?"

"මම- හෙක්ණා"

"සමන් බංඩාර ඇතුලේගම. උන් මොනවද ඔයාට කළේ?"

"මම - හෙක්ණා" ඔහු කතා කළේ යන්ත්‍රානු- කාරයෙනි.

උපසේන සුසුමක් හෙලුවේ අසරණ ආකාරයෙනි. "කොහොමද මේ මිනිහට චිත්ත ගත්වන්නෙ? මේ මිනිහගෙ මොළේම මොනවද කරලා! මොළේ සෝදලා- වෙන මොනවද දත්තයන් දාලා! කොහොමද මේක උනේ?'

"සමන් බණ්ඩාර- ඔයා සමන් බණ්ඩාර."

"මම- හෙක්ණා" තවත් පුදුමක් එසවා තව තැනකින් තබමින් හෙක්ණා කීවේය.

කර කියා ගත හැකි දෙයක් නැතිව උපසේන අනෙක් මිනිසා වෙතට ගමන් ගත්තේය. ඔහු සිහින් සිරුරකින් හෙබියෙකි. හෙක්ණා වෙත නැති කඩිසර ගතියක් ඔහු වෙත වෙයි.

"උදා!" උපසේන ඔහුට ලංව කීවේය.

"ඔව් - සර්"

"කවදද ආවෙ?"

"ටික දවසක් සර්"

"කොහේ ඉඳලද?"

"ගගසිරි පෝට්ලේ - ඉඳලා"

"ගග සිරි - පෝට්ලේ?"

"ඔව් සර්"

'ගගසිරි පෝට්ලේ - යම් යම් මතක මතුවූනත් දැන් උපසේනට කිසිවක් හරි හැටි සිහියක් කළ නොහැක. තමා මෙතැනට ඇවිත් දින කීයක් ගතවී දැයි ඔහුට මතකයක් නැත- සුසා - නිමල් - මේ සියල්ල කලඹු දිරයේ මඩ වගුරේ සැගවුණු මතකයන් මෙනි.

'පොත ලියන්න- කාලිංගගේ පොත ලියන්න...'

"උපසේන!"

ඇහැව කියා කතා කළේ කාලිංගයි. ඔහු අලුත්ම ලා කහ පැහැ ඇඳුම් කට්ටලයක් හැඳලාය. මුහුණ පුරා සිනාහවකි. ~~[illegible]~~ පෙනුම තේජස්වීය.

"උපසේන!"

"ඔව් කාලිංග."

"අද පාටිය - කීප දෙනා මුණ ගැසෙන්න පුළුවන් - හොඳට රෙස්ට් කළා නේද?"

"ඔව්. ඔව්"

"පොතේ වැඩේ පටන් ගන්නද?"

"ඔව්. ඔව්"

"අපි හෙට ගැ ටිකක් කතා කරමු. අද ගැ දන්නවනෙ? හරිම බිසී - තෑන් ස්ටොප්"

"තෑන් - ස්ටොප්" උපසේනද ප්‍රතිරාවය කළේය.

"එන් ජෝයි!" කාලිංග උපසේනගේ පිටට පහරක් ගැසුවේය. "ඩිනර් තියෙන්නෙ පස්සෙ. දැන් බඩ ගිනි නං සැන්ඩ්විච් තියෙනවා කන්න."

"සැන්ඩ්විච් - ඔව්."

"තව ටිකකින් මේ ආත්තෙන් බෝට්ටුව පිටි- ගෙස්ට් ලා අරගෙන."

"ගෙස්ට් ලා?"

"ඔව් අලුත් ගර්ල්ලාත් එනවා. වළි මෙනකල් ජොලි!"

"වළි මෙනකල් ජොලි?"

"ඔව් ඔව්. වළි මෙන කල් ජොලි උපා - එන්ජෝයි" කියමින් කාලිංග ගෙය තුළට ගියේය.

කාලිංගගේ ඉදිරියේ දම්වැල කින් බඳින ලද තිල්ලාට පරණ ඔරු කාවල උපසේනගේ නෙත ගැටුණි. කමාන් ශී වාගේ නොවේද? දම්වැලකින් බැඳුණු ෆලකට පෑනි බෝට්ටුවක්. ප්‍රත්‍යන්ත පලක් එක්ක අවලන් බෝට්ටුවක්.

හොක්කාන්, උදාන් පුටු පිටිවෙල කරද්දී උපසේන යළි සාලයට ගියේය.

මොකද මේසය මත සැන්ඩ්විච් වගී තිරයක්,

චීස් වගී කිවයක්ද, පීනට්ස්, ආමන්ඩ්ස්, කජු ආදී ඇට වගී කිවයක්ද, බඳුන් පුරවා තිබිණි. ඒ අතරෙන්නට වතුර සහ රස දියර.. විස්කෝතු වගී -

" කන්න. කන්න. " මෙහෙය මෙතට ආ විරේසා කීවාය. "සේරම - කන්න තමයි හැදුවෙ."

ඈ ආයින් කාමරයේ ඉඩු තුන් ගෙයකට ගියාය.

සත්විස් දෙකෙකුට හිට දැකී උපසේන ජිහිත් විස්කෝතු තුන හතරකුත් චීස් කෑලි තුන හතරකුත් කඩිනුයි පිහානක ලා ගෙන, කලපුව අතට ඇවිද ගියේය.

දැන් ඇ කාලුවර වැටෙමින් තිබිණි. එය බිඳින්නට මෙන් කලපුව මැදලින් පූර හඬක් පායා ආවේය.

ඇත එන බෝට්ටුවක යාත්‍ර එළිය ; එහි විදුලි සීනිත් සංගීතය උපසේනගේ ඉදුරන්ට ගොදුරු විය.